කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු / සැප්තැම්බර්

## සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON–E3015

සාර්ව ආර්ථික විද්‍යාව

<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි　　　　　　　　කාලය : පැය 03 යි

---

01. i. 'සාර්ව ආර්ථික විද්‍යාව' (Macroeconomics) විෂය ඔබ හඳුන්වා දෙන්නේ කෙසේද?

ii. රටක සාර්ව ආර්ථික ප්‍රතිපත්තියේ මූලික අරමුණු මොනවාද?

iii. 1930 ගණන්වලින් පසුව සාර්ව ආර්ථික විශ්ලේෂණයට වැදගත් ස්ථානයක් හිමිවූයේ ඇයි?

02. i. මුදල් ප්‍රමාණවාදයේ එන පිෂර් සමීකරණය (Fisher Equation) සහ කේම්බ්‍රිජ් සමීකරණය (Cambridge Equation) අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

ii. 'නව මුදල් ප්‍රමාණවාදය' යන්නෙන් කුමක් අදහස් වේද?

03. පොළී අනුපාතිකය (rate of interest) තීරණය වීම පිළිබඳව සම්භාව්‍ය හා කේන්සියානු න්‍යායයන් සන්සන්දනය කරන්න.

04. i. පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය (Cost–Push Inflation) සහ ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය (Demand –pull Inflation) අතර වෙනස පැහැදිලි කරන්න.

ii. උද්ධමනීය පරතරය හා අවධමනීය පරතරය පියවීමට සම්භාව්‍ය හා කේන්ස්ගේ න්‍යායන්ගෙන් ලැබෙන විසඳුම් විග්‍රහ කරන්න.

05. i. පිලිප්ස් වක්‍ර විශ්ලේෂණය (Phillips Curve Analysis) යන්නෙන් කුමක් අදහස් වේද?

ii. කෙටිකාලීන පිලිප්ස් වක්‍ර සහ දිගුකාලීන පිලිප්ස් වක්‍රය අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

06. "සේවා වියුක්තියට මූලික හේතුව වශයෙන් කේන්සියානු න්‍යාය මගින් පෙන්වා දී ඇත්තේ සඵල ඉල්ලුමේ (effective demand) ඇති ඌණතාවයයි." සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය සමග සසඳමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

07. "IS – LM විශ්ලේෂණය යනු භාණ්ඩ හා සේවා වෙළඳපොළේ සහ මුදල් වෙළඳ පොළේ පොලී අනුපාතිකය සහ මූර්ත නිමැයුම අතර සම්බන්ධතාව නිරූපණය කරන සාර්ව ආර්ථික උපකරණයකි." සාකච්ඡා කරන්න.

08. a) විවෘත ආර්ථිකයක 'ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය' රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.

b) පාරිභෝජන ශ්‍රිතය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

c) සරල ආවෘත ආර්ථිකයක සරළ රේඛීය පාරිභෝජන ශ්‍රිතය පහත දක්වේ.

$C = 50 + .8Y$

i. ආන්තික පාරිභෝජන නැඹියාව (MPC) ගණනය කර එය නිර්වචනය කරන්න.
ii. ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.
iii. ආන්තික ඉතුරුම් නැඹියාව (MPS) ගණනය කර එය නිර්වචනය කරන්න.
iv. ගුණකයේ අගය කොපමණද? ගුණකය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

<u>පැවරුම</u>

**ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ හෙක්ෂර් ඕලින් ආකෘතිය (Heckscher – Ohlin Model) රිකාඩියානු ආකෘතියට (Ricardian Model) වඩා ඉදිරියට යාමක් ලෙස සැළකිය හැකිද?**

<u>පැවරුම බාරදිය යුතු දිනය</u>

2010.09.18